ශීර්ෂය 220 - ආයුර්වේද දෙපාර්තමේන්තුව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් අඩංගු සම්පිණ්ඩන වාර්තාව 2021 අගෝස්තු 12 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමණාකරන විගණන වාර්තාව 2021 ඔක්තෝබර් 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ආයුර්වේද දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව, දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී තිබුණි.

(ආ) මෙම වාර්තාවේ 1.6.2(අ), 1.6.2 (ආ) හා 1.6.3 ඡේදයන්හි ඇතුළත් නිරීක්ෂණ සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය නොවන වත්කම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන හා වත්කම් උපලේඛනය අනුව 2020 දෙසැම්බර් 31 දිනට දේපල පිරියත හා උපකරණවල අගය පිළිවෙලින් රු.4,714,733,263 ක් හා රු.4,771,377,854 ක් වුවද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව එම අගය රු.3,919,728,286 ක් වූයෙන් වෙනස පිළිවෙලින් රු.795,004,977 ක් හා රු.851,649,568 ක් විය. වෙනසට හේතු හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි. | මෙම වෙනස්කම් හඳුනාගෙන අදාළ නිවැරදි කිරීම සඳහා අදාළ ජර්නල් සටහන් මහා භාණ්ඩාගාරය වෙත 2021 පෙබරවාරි මාසයේදී ඉදිරිපත් කළ බව. | දත්ත පරිගනකගත කිරීමේ වගකීම දරන නිලධාරීන්ගේ පුහුණුව සහ අවධානය වැඩි දියුණු කිරීමටත්, වැරදි නිවැරදි කිරීම පිණිස නිරන්තර අධීක්ෂණය සහ සැසඳුම් වැඩිදියුණු කිරීමටත් කටයුතු කිරීම මගින් මෙවැනි අඩුපාඩු වලක්වා ගත යුතුය. |

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව, ඇප තැන්පත් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | ඉදිරියේදී ඇප තැන්පතු තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ලබාගෙන නිවැරදිව ඇප ලේඛනය යාවත්කාලීන කරන බව. | මුදල් රෙගුලාසි 891(1) හි සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනය පවත්වා ගත යුතුය. |
| (ආ) | හානි හා පාඩු ලේඛනය පිළියෙල කර තිබුණු නමුත් එය මුදල් රෙගුලාසි 110 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණු අතර එය යාවත්කාලීන කරද නොතිබුණි. | හානි හා පාඩු ලේඛනය මුදල් රෙගුලාසි 110 හි සඳහන් ආකෘතිය අනුව නිවැරදිව යාවත්කාලීන කිරීමට උපදෙස් ලබාදී ඇති බව. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි හා පාඩු ලේඛනය පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මුදල් රෙගුලාසි 1645(අ) ප්‍රකාර වාහන ලොග් පොත් යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. | නිවැරදිව යාවත්කාලීන කිරීමට උපදෙස් ලබාදුන් බව. | මුදල් රෙගුලාසි 1645(අ) හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, පොදු 267 අකෘතියට අනුකූලව සෑම වාහනයක් සම්බන්ධයෙන්ම වාහන ලොග් පොත් යාවත්කාලීන කර පවත්වා ගත යුතුය. |

### 1.6.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර පාලනය සකස් කිරීම සඳහා සිදුකළ සියළු වෙනස්කම් සම්බන්ධයෙන් නිකුත්කරන චක්‍රලේඛ හා මහපෙන්වීම් අභ්‍යන්තර විගණක විසින් විගණකාධිපති වෙත යොමුකර ඇති බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 10 වන වගන්තිය | ආයුර්වේද ආරෝග්‍ය ශාලාවක්, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයක්, ආයුර්වේද ඖෂධ ශාලාවක් හෝ ආයුර්වේද බෙහෙත් ගබඩාවක් පවත්වා ගෙන යාමට ආයුර්වේද කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතු වුවද, පංචකර්ම සහ සම්බාහන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම පිළිබඳ විධිවිධාන පනතට ඇතුළත් කර නොතිබුණු බැවින් පංචකර්ම වෛද්‍ය ක්‍රමය භාවිතය නියාමනය කළ නොහැකිවී තිබුණි. කෙසේ වෙතත්, දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ නියෝගයක් පදනම් කරගෙන ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථාන 15 ක් හා හෝටල් තුළ ස්ථාපිත පංචකර්ම ආයතන 26 ක් ලියාපදිංචි කිරීමට කටයුතු කර තිබුණි. | ආයුර්වේද පනතෙහි 10 වගන්තිය ප්‍රකාරව ආයුර්වේද ආරෝග්‍ය ශාලාවක්, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයක්, ආයුර්වේද ඖෂධ ශාලාවක් හෝ ආයුර්වේද බෙහෙත් ගබඩාවක් පමණක් නියාමනය කළ හැකි බව, සම්භාහන මධ්‍යස්ථාන එම ගණයට අයත් නොවන බව හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ නියෝගය මත සංචාරක මණ්ඩලයේ අනුමැතියලත් හෝටල් සහ අනිකුත් සංචාරක ආකර්ශන ආයතන සඳහා පමණක් ලියාපදිංචිය ලබාදීම අනුමත කර ඇති බව. | පංචකර්ම සහ සම්බාහන මධ්‍යස්ථාන නියාමනය සඳහා විධිමත් නෛතික රාමුවක් ඇතිකිරීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 103 | වාහන අනතුරු 6 කට අදාළ රු.234,281 ක අලාභ රක්ෂණ වන්දිවලින් ආවරණය කර ගෙන තිබුණු නමුත් එම අනතුරු පිළිබඳව හා 2019 වර්ෂයේදී මධ්‍යම ගබඩාවේ පැවති රු.314,912 ක භාණ්ඩ ඌනතාවය පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඒ වන විට දෙපාර්තමේන්තුව සතුව පළපුරුදු පරිපාලන සේවයේ නිලධාරීන් නොසිටි බැවින් මෙවැනි අඩුපාඩු සිදුවී ඇති බව හා ඉදිරියේදී එවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 371(2) | ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිමකළ වහාම පියවිය යුතු වුවද, අවස්ථා 42 කදී නිකුත් කර තිබුණු රු.1,290,003 ක තත්කාර්ය අතුරු අග්‍රිම හා ඉතිරි මුදල් පියවීමට මාස 01 ත් මාස 06 ත් අතර කාලයක් ගතකර තිබුණි. තවද, නිලධාරීන් 07 දෙනෙකුට අවස්ථා 09 කදී නිකුත්කර තිබුණු රු.132,575 ක අතුරු අග්‍රිම අදාළ කාර්යය සඳහා යොදා නොගෙන දින 03 ත් දින 30 ත් අතර කාලයක් අත රඳවාගෙන ආපසු ගෙවා තිබුණි. | පියවීම් වවුචර්වල අඩුපාඩු, බිල්පත්වල මුල් පිටපත ලබා ගැනීමට ප්‍රමාදවීම, සේවා මුර ක්‍රමයට සේවයට පැමිණීම, පිට පළාත්වල වවුචර් තැපැල් මඟින් ලැබීම හා කොවිඩ් වසංගත තත්ත්වය වැනි හේතු නිසා තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිසි වේලාවට පියවිය නොහැකි බව, මාණ්ඩලික නිලධාරීන් සීමාසහිත බැවින් ඒ ඒ අවශ්‍යතාවය අනුව එක් නිලධාරියෙකුට කිහිප අවස්ථාවකදී අත්තිකාරම් ලබාදීමට සිදුවන බව, ඒ අනුව පළමු අග්‍රිමය නිරවුල් කිරීමට පෙර තවත් අග්‍රිමයක් ලබාදීමට සිදුවන බව හා මින් ඉදිරියට අග්‍රිම නොපියවන ලද නිලධාරීන්ගෙන් එම අග්‍රිම මුදල එළඹෙන වැටුපෙන් අයකිරීමට උපදෙස් ලබා දුන් බව. | මුදල් රෙගුලාසි විධිවිධානවලට අනුකූලවන ලෙස තත්ත්කාර්ය අතුරු අග්‍රිම පාලනය කළ යුතුය. |
| **(ඇ)** | 2019 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2(iv) ඡේදය | වේලාව පදනම් කර ගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීමේදී අදාළ කාලය ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ කර ගත යුතු වුවද, ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයකින් තොරව පැමිණීමේ ලේඛන පමණක් පදනම් කර ගනිමින් සමාලෝචිත වර්ෂය තුළදී අතිකාල හා නිවාඩු දින වැටුප් ලෙස ගෙවා තිබුණු මුළු මුදල හා අදාළ බැරකම්වල එකතුව රු.56,045,639 ක් විය. | 2020 වර්ෂයේදී ඇඟිලි සලකුණු යන්ත්‍ර සවිකළ නමුත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා නොකළ බැවින් දෙපාර්තමේන්තුව තුළද ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා කිරීම අවශ්‍ය නොවන බව අමාත්‍යාංශ ලේකම් විසින් දන්වා ඇති බව, 2021 අප්‍රේල් 01 දින සිට ඇඟිලි සළකුණු යන්ත්‍රය පදනම් කර ගනිමින් අතිකාල ගෙවීම ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබුණු නමුත් ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාදී නොමැති බව හා හිටපු වැඩ බලන ආයුර්වේද කොමසාරිස් විසින් කොවිඩ් වසංගතය පහව යනතුරු ඇඟිලි සළකුණු යන්ත්‍රය භාවිතා නොකරන ලෙසට සටහන් තබා ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් නිවැරදි හා තාත්වික ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු බව පහතින් දැක්වෙන නිරීක්ෂණවලට අනුව තහවුරු විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ---------------------------- | ------------- |
| (අ) | මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව, පුනරාවර්තන වැය විෂයයක් වෙත මාරු කර තිබුණු රු.10,365,000 ක සමස්ත ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි. . | ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම නිසා රු.මිලියන 10.8 ක පමණ බැරකම් පියවීමට නොහැකිවී ඇති බැවින් ප්‍රතිපාදන ඉතිරිවූ බව. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සහ පෙර වර්ෂවල වියදම් ප්‍රවනතාවයන් සැලකිල්ලට ගෙන ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතු අතර ඒ ඒ වැය විෂයට අදාළ වියදම් කළමනාකරණය කරගත යුතුය. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයයන් 5 කට අදාළ රු.117,470,000 ක් වූ ප්‍රතිපාදන ප්‍රමාණවත්වී නොතිබීම හේතුවෙන් රු.10,365,000 ක් මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කරගෙන රු.127,234,335 ක් වැය කිරීමෙන් පසුව රු.10,732,636 ක බැරකම්වලටද බැඳී තිබුණි. තවත් පුනරාවර්තන වැය විෂයයන් 4 ක් සඳහා සලසා තිබුණු රු.57,200,000 ක් වූ ප්‍රතිපාදනවලින් රු.56,893,462 ක් වැය කිරීමෙන් පසුව රු.4,662,484 ක බැරකම්වලටද බැඳී තිබුණි. | 2019 වර්ෂවලට අදාළ බැරකම් 2020 වර්ෂයේ ප්‍රතිපාදන වලින් නිරවුල් කිරීම නිසා 2020 වර්ෂයට ගිවිසුම් ගත සේවා වෙනුවෙන් වූ බැඳීම් වෙනුවෙන් ප්‍රතිපාදන කළමනාකරණය කරගත නොහැකි වූ බව, මෙම බැඳීම්ද ඇතුළත්ව 2020 අයවැය ලේඛනය පිළියෙල කළ නමුත් ප්‍රතිපාදන අඩුවෙන් ලැබුනු බව, සේවකයින්ගේ ඉල්ලීම මත අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රතිපාදන සීමාව පිළිබඳව විමසීමකින් තොරව අතිකාල දීමනා සඳහා අනුමත පැය ඉක්මවා අනුමැතිය ලබාදී තිබුණු බැවින් මෙම බැඳීම් සිදුවී ඇති බව. | ප්‍රතිපාදන ඉක්මවා වියදම් කිරීමට හෝ බැරකම්වලට බැඳීමට විධිවිධාන නොමැති බැවින් මූල්‍ය පාලනය නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | මූලධන වැය විෂයයක් සඳහා සලසාගෙන තිබුණු රු.1,000,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනය එම වැය විෂයයේ අරමුණුගත කාර්යය සඳහා වැය නොකර වෙනත් වැය විෂයයකට මාරුකර තිබුණි. | කයිතඩි රෝහලට Edge Runner යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා මුළු ප්‍රතිපාදනයම ලබා ගත නොහැකි වූ බැවින් රු.1,000,000 ක ප්‍රතිපාදනය ඉතිරිවූ බව හා කොවිඩ් වසංගතය මත නව යන්ත්‍ර සූත්‍ර ප්‍රසම්පාදන ක්‍රියාවලීන් ආරම්භ නොකළ | දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සහ පෙර වර්ෂවල වියදම් ප්‍රවනතාවයන් සැලකිල්ලට ගෙන ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතු අතර ඒ ඒ වැය විෂයයට අදාළ වියදම් කළමනාකරණය කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | බැවින් මෙම ඉතිරිවීම සිදුවූ බව. | |
| (ඈ) | මූලධන වැය විෂයයක් යටතේ සලසාගෙන තිබුණු රු.13,500,000 ක ප්‍රතිපාදනවලින් සියයට 75 කට වැඩියෙන් එනම් රු.10,200,000 ක් එම වැය විෂයයේ අරමුණුගත කාර්යය සඳහා වැය නොකර වෙනත් වැය විෂයයන්ට මාරුකර තිබුණු අතර තවත් මූලධන වැය විෂයයන් 4 ක් සඳහා සලසාගෙන තිබුණු රු.3,670,000 ක ප්‍රතිපාදනවලින් සියයට 50 ත් සියයට 94 ත් අතර පරාසයක ප්‍රතිපාදන රු.2,030,875 ක් ඉතිරිව තිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය මත නව ව්‍යාපෘති ආරම්භ නොකළ බව හා පාසල් හා පෙර පාසල් මාතෘ හා ළමා පෝෂණ වැඩසටහන් සංවිධානය කිරීමට නොහැකිවූ බව, ප්‍රසම්පාදනයට පෙර සූදානම්වීමේ වැය විෂයය යටතේ වෙන්වූ ප්‍රතිපාදනයෙන් රු.10,200,000 ක් වැඩ අවසන්වූ ව්‍යාපෘතියක හිඟ බිල්පත් පියවීම සඳහා මාරු කළ බව හා කොන්ත්‍රාත් කටයුතු කිරීමට නොහැකිවීම මෙන්ම රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීම නිසා අදාළ ප්‍රතිපාදන ඉතිරි වූ බව. | -එම- |
| (ඉ) | මූලධන වැය විෂයයන් 04 ක් සඳහා සලසාගෙන තිබුණු රු.39,530,000 ක ප්‍රතිපාදනවලින් සියයට 30 ක් එනම් රු.10,153,301 ක් අරමුණුගත කාර්යය සඳහා වැය කර නොතිබීම හේතුවෙන් ඉතිරිව තිබුණු අතර එක් එක් වැය විෂයයන්හි ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 24 සිට සියයට 48 දක්වා වූ පරාසයක පැවතුණි. තවත් වැය විෂයයන් දෙකක ප්‍රතිපාදනවලින් සියයට 18 ක් හා සියයට 35 ක් වශයෙන් එකතුව රු.5,309,940 ක් අරමුණුගත කාර්යය සඳහා වැය නොකර මාරු කර තිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් කොන්ත්‍රාත් කටයුතු කිරීමට නොහැකිවීම, අත්‍යවශ්‍ය අලුත්වැඩියා නොමැතිවීම අනුරාධපුර ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවයේ අරමුණුගත වැඩ සටහන් සීමා කිරීම ආදිය නිසා මෙම ඉතිරිවීම් සිදුවූ බව හා එම වර්ෂයේ අනපේක්ෂිත ලෙස රජය ගෘහ ආර්ථික දස ලක්ෂයක් නගාසිටුවීම ප්‍රමුඛ කාර්යයක් ලෙස හඳුන්වා දුන් බැවින් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදනද අවශ්‍යතාවය අනුව හදිසි අලුත්වැඩියා වෙනුවෙන් සහ හිඟ බිල්පත් පියවීමටද මාරු කිරීමට සිදුවූ බව. | -එම- |
| (ඊ) | මූලධන වැය විෂයයක් වන කාර්යමණ්ඩල පුහුණු වැය විෂයය සඳහා සලසා ගෙන තිබුණු රු.150,000 ක ප්‍රතිපාදනවලින් රු.146,000 ක් වැයකිරීමෙන් අනතුරුව රු.1,405,000 ක බැරකම්වලට බැඳී තිබුණි. | අතීතයේදී ආයතනය තුළ කිසිදු සම්බන්ධීකරණයක් නොමැතිව පශ්චාත් උපාධි පාඨමාලා සඳහා අනුමැතිය ලබාදී ඇති බව, එම අනුමැතිය මත ආයුර්වේද වෛද්‍යවරුන් විසින් පාඨමාලා ගාස්තු පෞද්ගලික මුදලින් ගෙවා ප්‍රතිපූර්ණය කිරීම සඳහා වව්චර් ඉදිරිපත් කරන බව, ඒ අනුව ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම් ඇති බව හා 2021 වර්ෂයේදී මේ සඳහා ලද ප්‍රතිපාදන මත එම බැඳීම් නිරවුල් කළ බව. | සැලසුම් සහගත බව තුළින් කාර්ය මණ්ඩල පුහුණුව වැනි මූලධන වියදම් පහසුවෙන් ඇස්තමේන්තු කළ හැකි වියදම් වන බැවින් මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කර ඒ අනුව ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 94(1) විධිවිධාන වලට පටහැනිව, පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 11 ක රු.912,544 ක් වූ ඉතිරිවීම් ඉක්මවා රු.15,929,736 ක බැරකම් වලට බැදී තිබුණු අතර තවත් ප්‍රාග්ධන වැය විෂයයක් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණු නමුත් රු.200,401,423 ක බැරකම් වලට බැදී තිබුණි. | සේවකයින්ගේ ඉල්ලීම මත අමාත්‍යාංශ ලේකම් විසින් අතිකාල දීමනා අනුමත පැය ගණන වැඩිකර අනුමැතිය ලබාදී තිබුණු බැවින් මෙම බැදීම් සිදුවී ඇති බව, 2019 වර්ෂයට අක්මුදල් නොලැබීම මත රු.200,401,423 ක බැරකම් 2020 වර්ෂයට ඉදිරියට ගෙන ආ බව හා 2021 වර්ෂයේ මේ සඳහා ලද ප්‍රතිපාදන මත එම බැදීම් නිරවුල් කළ බව. | මුදල් රෙගුලාසි විධිවිධානවලට පටහැනිව කටයුතු නොකළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ඖෂධ සංස්ථාවෙන් ඉකුත් වර්ෂවලදී ලබාගෙන තිබුණු ඖෂධ වෙනුවෙන් රු.1,253,831 ක්ද සමාලෝචිත වර්ෂය තුළදී ලබාගෙන තිබුණු ඖෂධ වෙනුවෙන් රු.2,319,362 ක්ද ගෙවීමට ඇති බව එම සංස්ථාවේ ගිණුම්වලට අනුව තහවුරු වූ නමුත් එම වටිනාකම් බැදීම් හා බැරකම් ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. | ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සැපයුම් අංශය විසින් ඒ ඒ රෝහල් වල අවශ්‍යතාවය පරිදි ඇනවුම් නිකුත් කළද එම ඇනවුමට අදාළ සියළුම ඖෂධ ඒ ඒ රෝහල් වෙත සපයන බව හා එම රෝහල් විසින් වවුචර් පිළියෙල කර එවීම ප්‍රමාද කළහොත් බැරකම් ලේඛනයට ඇතුළත් කළ නොහැකි බව. | සියළු බැදීම් හා බැරකම්, බැදීම් හා බැරකම් ප්‍රකාශයට ඇතුළත් කළ යුතුය. |

### 2.3 අත්තිකාරම් ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ නිලධාරීන්ට අත්තිකාරම් බී ගිණුමේ සැසඳුම් ප්‍රකාශනය ප්‍රකාරව, 2020 දෙසැම්බර් 31 දිනට නිලධාරීන් 39 දෙනෙකුගෙන් අයවීමට තිබුණු වර්ෂ 5 ඉක්ම වූ ණය ශේෂවල එකතුව රු.මිලියන 1.65 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළදී වර්ෂ 5 ඉක්මවූ ණය වලින් රු.587,450 ක් පමණක් අයකර තිබුණි. ස්ථාන මාරුවී ගිය, මිය ගිය, වැඩ තහනම් කළ සහ සේවය හැර ගිය නිලධාරීන්ගේ ණය අයකර ගැනීම දුර්වල තත්වයක පැවතුණි. | පළාත් සභාවලට මාරුවී වර්ෂ 05 කට වඩා වැඩි කාලයක් ගතවී ඇති නිලධාරීන්ගේ ණය ශේෂයන් තම ආයතන සතුව නොමැති බව, එම පළාත් සභා විසින් දන්වා ඇති බැවින් එම ණය ශේෂයන් සම්බන්ධයෙන් අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරන බව, වර්ෂ 05 ට වැඩි මිය ගිය නිලධාරීන්ගේ මුළු ණය ශේෂය රු.290,100 ක් වන අතර ඉන් රු.114,550 ක් මරණ පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට කටයුතු කරන බව, විශ්‍රාම ගිය වර්ෂ 05ට වැඩි නිලධාරීන්ගේ ණය වර්ෂ 20 ත් වර්ෂ 30 ත් අතර කාලයක් පැරණි බැවින් ඒවා කපා හැරීමට කටයුතු කරමින් පවතින බව, වර්ෂ 05 ට වැඩි සේවය | 2021 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීමට පෙර පිළිතුරේ සඳහන් ආකාරයට අදාළ නිරවුල් කිරීම් සිදුකර අවසන් කළ යුතුය. |

අතහැරගොස් ඇති නිලධාරීන්ගේ ණය ශේෂය රු.847,760 කින් මේ වන විට රු.13,200 ක් අයකර ඇති බව හා ඉතිරිය සහ වර්ෂ 05ට වැඩි වැඩ තහනම් කර ඇති නිලධාරීන්ගේ ශේෂය රු.192,960 ක් සම්බන්ධයෙන් අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරන බව.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන 2001 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා නියමු ව්‍යාපෘතියක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට අවසර ලබාදී තිබුණු අතර එහි සාර්ථකත්වය මත ව්‍යාපෘති ඇගයීමක් සිදු කොට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු 2005 වර්ෂයේ සිට අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා සේවා ව්‍යාප්ත කරමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු විය. නමුත් එපරිදි කටයුතු නොකර වර්ෂ 15 ක් අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පමණක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. 2005 වර්ෂයේ සිට ඉකුත් වර්ෂය දක්වා රු.මිලියන 608 ක් වැය කර තිබුණු මෙම ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සලසා තිබුණු රු.මිලියන 142.71 ක ප්‍රතිපාදනවලින් නිලධාරීන් 225 දෙනෙකුට වැටුප් හා දීමනා වශයෙන් රු.මිලියන 133.72 ක්ද අනෙකුත් වියදම් සඳහා රු.මිලියන 4.14 ක්ද වශයෙන් මුළු එකතුව රු.මිලියන 138 ක් වැයකර තිබුණි. අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා සේවා ව්‍යාප්ත කිරීම සම්බන්ධව 2005 වර්ෂයේදී අමාත්‍යාංශ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබුණද ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරන බව. | අමාත්‍යය මණ්ඩල පත්‍රිකාව ප්‍රකාරව අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා සේවා ව්‍යාප්ත කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මැදවච්චිය වකුගඩු රෝහල ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු මුදල් රු.85,372,218 ක් 2014 වර්ෂයේදී රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත යවා තිබුණි. 2019 දෙසැම්බර් මාසයේදී ඉදිකිරීම් අවසාන කිරීමෙන් පසු අතිරික්ත මිලදී ගැනීම් හේතුවෙන් ඉතිරි වූ රු.1,683,644 ක් වටිනා ගොඩනැගිලි ද්‍රව්‍ය දෙපාර්තමේන්තුව වෙත බාරදී තිබුණි. නමුත් එපරිදි ඉතිරිව තිබුණු වානේ කම්බි, වටිනා ලී වර්ග ඇතුළු ගොඩනැගිලි ද්‍රව්‍ය රැසක් අනාරක්ෂිතව, අක්‍රමවත්ව හා නිෂ්කාර්යව වර්ෂයකට අධික කාලයක් දෙපාර්තමේන්තු පරිශ්‍රයේ ගොඩගසා තිබුණි. | මේ සම්බන්ධව ප්‍රධාන ගණකාධිකාරී විසින් කිහිප අවස්ථාවකම මෙම ගොඩනැගිලි ද්‍රව්‍ය වෙන්දේසි කිරීමට උත්සාහයක් ගෙන තිබුණද අමාත්‍යාංශ ලේකම්ගේ මැදිහත්වීම මත එම වෙන්දේසිය නවතා ඇති බව. | තාක්‍ෂණික දැනුම සහිත පුද්ගලයින් මගින් පිළියෙල කරන විධිමත් පිරිවැය ඇස්තමේන්තුවලට අනුකූලව අවශ්‍යතාවය අනුව පමණක් ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගත යුතුය. රජයට සිදුවන අලාභය අවම වන ආකාරයට සහ විනිවිද පෙනෙන ප්‍රසම්පාදන ක්‍රියවලියකට අනුව නිෂ්කාර්ය වත්කම් බැහැර කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන හා ශක්‍යතා අධ්‍යයනයකින් තොරව 2015 මාර්තු 16 දින රු.මිලියන 28 ක් වැයකර බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණායතනයට යන්ත්‍ර හා උපකරණ 14 ක් මිලදී ගෙන තිබුණු අතර ඉන් රු.මිලියන 21 ක් වටිනා යන්ත්‍ර 8 ක් 2021 ඔක්තෝබර් 15 වන විටත් සවිකර නොතිබුණි. මුළු පිරිවැය රු.14,591,311 ක් වූ යන්ත්‍ර 06 ක් නිෂ්පාදනාගාරය සඳහා අවශ්‍ය නොවන බවට 2020 ඔක්තෝබර් 05 දින පත්කර තිබුණු කමිටුවක් විසින් හඳුනාගෙන තිබුණි. නිසි කොන්ත්‍රාත් ගිවිසුමකට සහ සේවා හා අළුත්වැඩියා සඳහා ගිවිසුම්වලට එළඹීමකින් තොරව මෙම කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කර තිබුණු බැවින් සවිකර තිබුණු යන්ත්‍ර උපකරණද සමාලෝචිත වර්ෂය වන විට භාවිතයට ගත නොහැකි තත්වයේ පැවතුණි. මේ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා වැය කර තිබුණු රු.28,342,712 ක මුළු මුදල අනාර්ථික වියදමක් විය. | නාවින්න පර්යේෂණායතනයේ පවතින යන්ත්‍ර හා උපකරණ පිළිබඳව විශේෂඥ කමිටුවක් මඟින් පරීක්ෂණයක් සිදුකර මේ සම්බන්ධයෙන් ඉදිරිකටයුතු කරන ලෙස අමාත්‍යාංශ ලේකම් විසින් දන්වා ඇති බැවින් ඒ අනුව ඉදිරි කටයුතු කරන බව. | සියළුම යන්ත්‍ර ඵලදායි ලෙස උපයෝජනය කිරීමට හෝ ආයුර්වේද රෝහල්වල හෝ ආයුර්වේද සංස්ථාවේ ඖෂධ නිෂ්පාදනයට යොදා ගැනීම සඳහා ලබාදීමට කටයුතු කළ යුතු අතර අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන හා නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව මෙම මිලදී ගැනීම සඳහා දායක වූ සියළුම නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගත යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 2,647 ක් වුවද, එදිනට තථ්‍ය කාර්යය මණ්ඩලය 1,679 ක් වූයෙන් අනුමත කාර්යය මණ්ඩලයෙන් සියයට 37 කට සමාන පුරප්පාඩු සංඛ්‍යාව 968 ක් විය. එම පුරප්පාඩු තුළ බණ්ඩාරනායක අනුස්මරණ පර්යේෂණායතනයේ හා ආයුර්වේද ශික්ෂණ රෝහලේ පිළිවෙලින් පුරප්පාඩු 140 ක් හා 385 ක් වූ අතර ආයුර්වේද රෝහල් 9 ක් ඇතුළු ආයතන 11 ක පුරප්පාඩු සංඛාව 6 ත් 385 ත් අතර අතර පරාසයක විය. තවද දෙපාර්තමේන්තුවට අයත් ඔසු උයන් 8 ක පුරප්පාඩු සංඛ්‍යාව 01 ත් 35 ත් අතර පරාසයක පැවතුණි. | අධි ශ්‍රේණියේ තනතුරුවල ඉතිරි පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව, විශේෂඥ වෛද්‍ය නිලධාරී පුරප්පාඩු 88 ක් සම්පූර්ණ කිරීම සඳහා පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයෙන් නිලධාරීන් 14 ක් පමණක් සුදුසුකම් සම්පූර්ණ කර තිබුණු බව, ගොවිපල කළමනාකරු තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව අයදුම්පත් කැඳවීමට යෝජනා කර ඇති බව, ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරී තනතුරු පුරප්පාඩු 157 ක් මේ වන විට සම්පූර්ණ කර ඇති බව, පරිපාලන නිලධාරී හා රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරී පුරප්පාඩු සම්පූර්ණ කිරීම අමාත්‍යාංශය මඟින් සිදු කරන බව, හෙද නිලධාරීන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් ප්‍රමාණවත් තරම් දෙපාර්තමේන්තුවට නොලැබෙන බැවින් සෞඛ්‍ය අමාත්‍යාංශයට බඳවා ගන්නා ලද හෙද නිලධාරීන්ගෙන් යම් ප්‍රතිශතයක් ආයුර්වේද දෙපාර්තමේන්තුව සඳහා අනුයුක්ත කර දෙන ලෙස ඉල්ලා ඇති බව, ආයුර්වේද සේවා සහායක පුරප්පාඩු සම්පූර්ණ කිරීමට සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇති බව, ඖෂධ සංයෝජක වැනි තනතුරු සේවා සහායක තනතුරේ උසස්වීම් වන බැවින් සේවා සහායක තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමෙන් තොරව එම පුරප්පාඩු සම්පූර්ණ කළ නොහැකි බව, ඔසු උයන්හි පවතින තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා ඇති බව. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු සහ රෝහල්වල අත්‍යවශ්‍ය තනතුරුවලට ප්‍රමුඛතාව දෙමින් අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |